ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2017/03/21 |

## 2017 පෙබරවාරි මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.ද.) (2013=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2017 ජනවාරි මාසයේ දී වාර්තා කළ සියයට 6.5 හි සිට 2017 පෙබරවාරි මාසයේ දී සියයට 8.2 දක්වා ඉහළ ගියේය. 2017 පෙබරවාරි මස ලක්ෂ්‍යමය උද්ධමනය කෙරෙහි ආහාර කාණ්ඩය මෙන්ම ආහාර නොවන කාණ්ඩය ද දායක විය. 2017 පෙබරවාරි මාසයේ දී ලක්ෂ්‍යමය උද්ධමනයෙහි සිදු වූ සැලකිය යුතු ඉහළ යෑමට 2016 පෙබරවාරි මාසයේ දී පැවැති අඩු පදනම් අගය ප්‍රමුඛතම සාධකය වූ අතර මාසික මිල ගණන්වල දක්නට ලැබුණු ඉහළ යෑම ද හේතු විය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි වෙනස 2017 ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 4.6 හි සිට 2017 පෙබරවාරි මාසයේ දී සියයට 5.1 දක්වා ඉහළ ගියේය.

මාසික වෙනස්වීම සැලකූ විට ජා.පා.මි. දර්ශකය 2017 ජනවාරි මාසයේ වාර්තා වූ දර්ශක අංක 119.3 සිට 2017 පෙබරවාරි මාසයේ දී දර්ශක අංක 119.9 දක්වා ඉහළ ගියේය. ආහාර කාණ්ඩයට අයත් අයිතමයන්හි මිල ගණන් ඉහළ යෑම මෙම

මාසික ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ආහාර කාණ්ඩය තුළ පොල්, එළවළු වර්ග, පොල්තෙල්, අමු මිරිස් සහ මාළු මිල ගණන් මාසය තුළ දී ඉහළ ගියේය. ආහාර නොවන කාණ්ඩය තුළ ප්‍රවාහන; අධ්‍යාපන; නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු; විවිධ භාණ්ඩ හා සේවා; සහ රෙදිපිළි හා පාවහන් උපකාණ්ඩයන්හි මිල ගණන් ඉහළ ගියේය. ආපනශාලා සහ හෝටල් උපකාණ්ඩයෙහි මිල ගණන් සුළු වශයෙන් ඉහළ ගියේය. මධ්‍යසාර පාන හා දුම්කොළ; සහ විනෝදාත්මක හා සංස්කෘතික උපකාණ්ඩයන්හි මිල ගණන් 2017 පෙබරවාරි මාසය තුළ දී පහළ ගිය අතර සෞඛ්‍ය උපකාණ්ඩයෙහි මිල ගණන් සුළු පහළ යෑමක් වාර්තා කළේය. මේ අතර, සන්නිවේදන උපකාණ්ඩයෙහි මිල ගණන් මාසය තුළ දී නොවෙනස්ව පැවතුණි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන ජා.පා.මි.ද. මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2017 පෙබරවාරි මාසයේ දී පැවති සියයට 7.1 හි නොවෙනස්ව පැවතිණි. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2017 ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 6.2 සිට 2017 පෙබරවාරි මාසයේ දී සියයට 6.4 දක්වා ඉහළ ගියේය.



**ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම**
**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | මාසික % වෙනස | ලක්ෂ්‍යමය % වෙනස | වාර්ෂික සාමාන්‍ය% වෙනස |
|---|---|---|---|---|---|
| 2015 | ජනවාරි | 112.8 | 3.9 | 9.4 | |
| | පෙබරවාරි | 108.9 | -3.5 | 5.7 | |
| | මාර්තු | 107.6 | -1.2 | 4.3 | |
| | අප්‍රේල් | 107.0 | -0.6 | 2.8 | |
| | මැයි | 108.0 | 0.9 | 3.0 | |
| | ජුනි | 109.1 | 1.0 | 2.7 | |
| | ජූලි | 108.9 | -0.2 | 1.8 | |
| | අගෝස්තු | 108.4 | -0.5 | 1.9 | |
| | සැප්තැම්බර් | 108.4 | 0.0 | 1.9 | |
| | ඔක්තෝබර් | 109.2 | 0.7 | 3.0 | |
| | නොවැම්බර් | 112.0 | 2.6 | 4.8 | |
| | දෙසැම්බර් | 113.2 | 1.1 | 4.2 | 3.8 |
| 2016 | ජනවාරි | 112.0 | -1.1 | -0.7 | 2.9 |
| | පෙබරවාරි | 110.8 | -1.1 | 1.7 | 2.6 |
| | මාර්තු | 110.0 | -0.7 | 2.2 | 2.4 |
| | අප්‍රේල් | 111.6 | 1.5 | 4.3 | 2.6 |
| | මැයි | 113.7 | 1.9 | 5.3 | 2.7 |
| | ජුනි | 116.1 | 2.1 | 6.4 | 3.1 |
| | ජූලි | 115.2 | -0.8 | 5.8 | 3.4 |
| | අගෝස්තු | 113.3 | -1.6 | 4.5 | 3.6 |
| | සැප්තැම්බර් | 113.5 | 0.2 | 4.7 | 3.8 |
| | ඔක්තෝබර් | 114.7 | 1.1 | 5.0 | 4.0 |
| | නොවැම්බර් | 116.6 | 1.7 | 4.1 | 4.0 |
| | දෙසැම්බර් | 118.0 | 1.2 | 4.2 | 4.0 |
| 2017 | ජනවාරි | 119.3 | 1.1 | 6.5 | 4.6 |
| | පෙබරවාරි | 119.9 | 0.5 | 8.2 | 5.1 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව